# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2340/02 - 2023 ජූලි මස 10 වැනි සඳුදා - 2023.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 5/2022

**2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත**

2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුවේ උපදෙස් සහ නිර්දේශ මත ඒ පනතේ 5 වන සහ 6 වන වගන්ති සමග කියවිය යුතු, ඒ පනතේ 7 වන වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**කංචන විජේසේකර,**
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2023 ජූලි මස 10 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2023 අංක 1 දරන ඛනිජතෙල් නිෂ්පාදන බලපත්‍ර ලබාදීමේ නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝග, යම් අයදුම්කරුවකුට සහ පනතේ 5 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සඳහා මේ නියෝග යටතේ බලපත්‍රයක් ප්‍රදානය කරන ලද යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට අදාළ විය යුතු ය.

**I වන කොටස**

***බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසි***

3. (1) යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින්, පනතේ 5 වන වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා, (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මේ නියෝග ප්‍රකාරව අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන අනුනියෝගය යටතේ වන අයදුම්පත්‍රයක්, ලේකම්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ආකෘතියට සාරානුකූල විය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) (1) වන අනුනියෝගය යටතේ වන සෑම අයදුම්පත්‍රයක් ම, ඛනිජතෙල් ක්ෂේත්‍රයේ අවශ්‍යතා සහ ජාතික ආර්ථිකයේ යහපත සඳහා ශ්‍රී ලංකාව තුළට ඛනිජතෙල් ආනයනය කිරීම, ශ්‍රී ලංකාවෙන් ඛනිජතෙල් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සිදු කිරීම සඳහා (1) වන අනුනියෝගය යටතේ (මෙහි මින්මතු "අයදුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලබන තැනැත්තාගේ හෝ පුද්ගල මණ්ඩලයේ මූල්‍යමය සහ තාක්ෂණික හැකියාව තහවුරු කරනු ලබන යෝජනාවක් ද සමගින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. 3 වන නියෝගයේ (1) වන සහ (3) වන අනුනියෝගවල සඳහන් අයදුම්පත්‍රය සහ යෝජනාව සලකා බැලීමේ දී, ඛනිජතෙල් ආනයනය කිරීම, අපනයනය කිරීම, විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සිදු කිරීම සඳහා වන අයදුම්කරුගේ මූල්‍යමය සහ තාක්ෂණික හැකියාවට අදාළ කර්මාන්ත ප්‍රමිතීන් මත පදනම්ව (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද කමිටුව විසින් නිසි උද්යෝගය සහිත විධිමත් ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

5. අමාත්‍යවරයා විසින්, පනතේ 5 වන වගන්තිය ප්‍රකාරව (මෙහි මින්මතු "බලපත්‍රලාභී ක්‍රියාකාරකම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවට ඛනිජතෙල් ආනයනය කිරීම, ශ්‍රී ලංකාවෙන් ඛනිජතෙල් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළ ඛනිජතෙල් විකිණීම, සැපයීම හෝ බෙදාහැරීම සඳහා අයදුම්කරුවකු වෙත බලපත්‍රයක් ප්‍රදානය කරනු ලබන අවස්ථාවක දී, ඒ අයදුම්කරු විසින් බලපත්‍රලාභී ක්‍රියාකාරකම ආරම්භ කිරීමට පෙරාතුව-

(අ) ඒ අයදුම්කරු, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් නොවේ නම්, ඒ පනත යටතේ සමාගමක් ලෙස සංස්ථාගත කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු ය;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ වන අවශ්‍යතාවන්ට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතු ය; සහ

(ඇ) බලපත්‍රය ප්‍රදානය කරන ලද ක්‍රියාකාරකම සැලකිල්ලට ගෙන කමිටුව විසින් නිශ්චිතව දක්වනු ලබන වෙනත් යම් අධිකාරියක් සමග ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

6. අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරනු ලබන බලපත්‍රය යටතේ අයදුම්කරු විසින් සිදු කිරීමට බලය පවරන ලද බලපත්‍රලාභී ක්‍රියාකාරකම, ඒ බලපත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

7. (මෙහි මින්මතු "බලපත්‍රලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) බලපත්‍රයක් ප්‍රදානය කරන ලද සෑම අයදුම්කරුවකු ම, මේ නියෝග සහ ඒ සඳහා කලින් කල සිදු කරනු ලබන සංශෝධනවල නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව බලපත්‍රලාභී ක්‍රියාකාරකම, සිදු කරගෙන යා යුතු ය.

## II වන කොටස

### *බලපත්‍රලාභියකුට අදාළ වන්නා වූ සාමාන්‍ය කොන්දේසි*

8. බලපත්‍රලාභියා විසින්, 5 වන නියෝගයේ (ඇ) ඡේදය යටතේ ඇතුළත් වූ ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට අනුකූලව, 1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හෝ ආණ්ඩුවට අයත් ව්‍යාපාර ආයතන පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය යටතේ නිසි පරිදි සංස්ථාගත කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති ලංකා ඛනිජතෙල් තොග ගබඩා පර්යන්ත සමාගම වෙතින් යටිතල පහසුකම් ලබාගනු ලැබිය හැකි ය.

9. (1) සෑම බලපත්‍රයක් ම-

(අ) ඇමරිකානු ඩොලර් මිලියන දෙකක (ඇ.ඩො. 2,000,000) බලපත්‍ර ගාස්තුවක් ගෙවීමෙන් පසු, වසර විස්සක (20) කාලයක් සඳහා වලංගු විය යුතු ය;

(ආ) පවරනු ලැබිය නොහැකි විය යුතු ය; සහ

(ඇ) අලුත් කළ හැකි විය යුතු ය.

(2) සෑම බලපත්‍රලාභියකු විසින් ම ලේකම්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන දින හෝ එදිනට පෙර එක් එක් සහ සෑම වසරකදී ම බලපත්‍ර ගාස්තුව වන ඇමරිකානු ඩොලර් මිලියන දෙකක (ඇ.ඩො. 2,000,000) මුදල ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් බලපත්‍රලාභියකු විසින්, ලේකම්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති දිනට හෝ ඒ දිනයට පෙරාතුව (1) වන අනුනියෝගයේ (අ) ඡේදයේ සඳහන් බලපත්‍ර ගාස්තුව ගෙවීම පැහැර හරිනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ඒ බලපත්‍රලාභියා වෙත ප්‍රදානය කරන ලද බලපත්‍රය අවලංගු කරනු ලැබිය යුතු ය.

(4) (අ) යම් බලපත්‍රලාභියකු විසින්, බලපත්‍රයේ යම් කොන්දේසියක් කඩ කරනු ලබන අවස්ථාවක දී, ලේකම්වරයා විසින් ඒ සඳහා හේතු දක්වා ඒ බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැකි ය.

(ආ) ලේකම්වරයා විසින්, (අ) ඡේදයේ සඳහන් අත්හිටුවීම, ඒ අත්හිටුවීමේ දිනය සඳහන් කරමින්, බලපත්‍රලාභියා වෙත දැන්විය යුතු අතර, ඒ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ නිවැරදි කිරීමේ පියවර ගනු ලැබීමට බලපත්‍රලාභියා වෙත නියම කළ යුතු ය.

(ඇ) බලපත්‍රලාභියා විසින් නිවැරදි කිරීමේ පියවර ගැනීමෙන් පසු සහ ලේකම්වරයා විසින් ඒ පියවර පිළිබඳව සෑහීමකට පත්වනු ලබන අවස්ථාවක දී, ලේකම්වරයා විසින් ඒ අත්හිටුවීම ඉවත් කර ගත හැකි ය.

10. (1) යම් වැඩිදුර කාලසීමාවක් සඳහා බලපත්‍රය අලුත් කරවා ගැනීමට අදහස් කරනු ලබන යම් බලපත්‍රලාභියකු විසින්, ඒ බලපත්‍රය කල් ඉකුත්වන දිනට මාස හයකට (6) නොඅඩු කාලයකට පෙරාතුව, ලේකම්වරයා විසින් නිශ්චිතව දක්වා ඇති ආකෘතිය මගින් ලේකම්වරයා වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන සෑම අයදුම්පත්‍රයක්ම, 3 වන නියෝගයේ (3) වන අනුනියෝගයට අනුකූලව යෝජනාවක් සමග ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගය යටතේ බලපත්‍ර අලුත් කිරීමක් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් 4 වන නියෝගයේ විධිවිධාන අදාළ විය යුතු ය.

11. සෑම බලපත්‍රලාභියකු විසින් ම, බලපත්‍රලාභී ක්‍රියාකාරකම සිදු කිරීමේ දී, පාරිභෝගිකයින්ගේ අයිතීන් ආරක්ෂා වන බවට සහ 2021 මාර්තු මස 29 දිනැති "ඛනිජතෙල් නිෂ්පාදන පරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ වගකීම් ස්ථාපනය කිරීමෙන් සහ පැමිණිලි හැසිරවීමට සහ ආරවුල් නිරාකරණය කිරීම මගින් ඔවුන්ව බලාත්මක කිරීම" යන මැයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය මත පදනම්ව ආණ්ඩුව විසින් පාරිභෝගිකයින් පිළිබඳව නිකුත් කර ඇති විධාන හෝ මාර්ගෝපදේශවලට සහ ඒ සඳහා කලින් කල සිදුකරන ලද සංශෝධනයන්ට අනුකූලව කටයුතු කරනු ලබන බවට සහතික විය යුතු ය.

12. සෑම බලපත්‍රලාභියකු ම, ඔහු විසින් සිදු කරනු ලබන බලපත්‍රලාභී ක්‍රියාකාරකමට අදාළ වන සෑම ලිඛිත නීතියක ම විධිවිධානවලට සහ 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සහ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ඇතුළු බලපත්‍රලාභියාට අදාළ වන්නා වූ සෑම ලිඛිත නීතියක ම විධිවිධානවලට ද යටත් විය යුතු ය.

## III වන කොටස

### *ඇතැම් බලපත්‍රලාභීන් සඳහා අදාළ වන්නා වූ විශේෂ කොන්දේසි*

13. සෑම බලපත්‍රලාභියකු විසින් ම, ඔහු වෙත බලපත්‍රය ප්‍රදානය කරනු ලැබ ඇත්තේ යම් ඛනිජතෙල් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද ඒ ඛනිජතෙල් නිෂ්පාදනය, කලින් කලට ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතීන් හා ක්‍රියාපටිපාටීන්ට අනුකූලව, බෙදා හරිනු ලැබිය යුතු ය.

14. ඛනිජතෙල් අපනයනය කිරීම සඳහා බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ ඇති යම් බලපත්‍රලාභියකු විසින්, ඒ බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති විශේෂ කොන්දේසිවලට යටත්ව ඒ ක්‍රියාකාරකම සිදු කළ යුතු ය.

## IV වන කොටස

### *සාමාන්‍ය*

15. මේ නියෝගවල-

"පනත" යන්නෙන්, 2002 අංක 33 දරන ඛනිජතෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත අදහස් වේ.

EOG 07 - 0069

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.